# ජාතික ලුණු සමාගම

## (කර්මාන්ත අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ)

ජාතික ලුණු සමාගම කර්මාන්ත අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ පවතින රජය සතු සමාගමක් වන අතර, සමාගම අලිමංකඩ ලුණු ලේවාය සංවර්ධනය කිරීමේ ක්‍රියාවලියේ වර්තමානයේ යෙදී සිටියි. අලිමංකඩ (කිලිනොච්චියේ) පිහිටි අපගේ ලුණු ලේවායේ කොන්ත්‍රාත් පදනම මත පහත සඳහන් තනතුරේ සේවය කිරීම සඳහා උද්යෝගිමත් හා අභිප්‍රේරණීය පුද්ගලයන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. තෝරාගනු ලබන සේවකයා අවශ්‍යතාවන් පරිදි කොළඹ ප්‍රධාන කාර්යාලයට වාර්තා කළ යුතුවේ.

# ව්‍යාපෘති උපදේශක තනතුර

අපගේ අලිමංකඩ ලුණු ලේවායේ අපගේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සහාය වීම සඳහා උසස් හැකියාවන් වලින් පිරි ව්‍යාපෘති උපදේශකයෙකුගේ සේවාව අපි සොයන්නෙමු. ඔබ, නිර්දිෂ්ට ආයෝජකයන් හා සහයෝගිත්වයෙන් හා ව්‍යාපෘති ඉලක්ක කරා සම්පත් පවරමින් ව්‍යාපෘති සැලැස්ම සංවර්ධනය කළ යුතු අතර, ව්‍යාපෘතියේ ප්‍රගතිය පිළිබඳ යාවත්කාලීන කළ තොරතුරු සභාපති හා සාමාන්‍යාධිකාරී වෙත වාර්තා කළ යුතුය.

**ව්‍යාපෘති විස්තර :**

අ. පැ/මෙ. ටො. 5 ක මේස ලුණු යන්ත්‍රාගාරයක් සැපයීම, ගෙනැවිත් භාරදීම, ස්ථාපනය හා ක්‍රියාත්මක කොට පෙන්වීමේ ප්‍රසම්පාදනය

ආ. උපරිම සම්පත් භාවිතයෙන් නිෂ්පාදන ධාරිතාව වැඩි දියුණු කිරීම සඳහා අලිමංකඩ ලුණු ලේවා නිෂ්පාදන ප්‍රදේශය පුනරුත්ථාපනය කිරීම හා නවීකරණය කිරීම

## ව්‍යාපෘති උපදේශක සතුවිය යුතු අවශ්‍යතා

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ඉංජිනේරු විද්‍යා (සිවිල් / යාන්ත්‍රික / නිෂ්පාදන) පිළිබඳ හෝ අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් ලබා තිබීම සමග ව්‍යාපෘති කළමනාකරණ ක්ෂේත්‍රයේ පශ්චාත් (මාස්ටර්ස්) උපාධියක් ලබා තිබීම වැඩි වාසියක් වනු ඇත.
- කර්මාන්ත ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 10 ක පශ්චාත් උපාධි පළපුරුද්ද සමග යන්ත්‍රාගාරයක් ක්‍රියාත්මක කොට පෙන්වීම / යන්ත්‍ර හා / හෝ යටිතල පහසුකම් සංවර්ධනය යන ක්ෂේත්‍රයේ විශේෂයෙන් ව්‍යාපෘති උපදේශාත්මක සේවාව පිළිබඳව අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්ද තිබීම
- කැපී පෙනෙන ලිඛිත හා වාචික සන්නිවේදන නිපුණතාවය
- විශිෂ්ඨ නායකත්ව නිපුණතාවය
- විවිධ කොටස්කරුවන් සමග සහයෝගිතාවයෙන් කටයුතු කිරීමේ හැකියාව
- විශිෂ්ඨ සංවිධානය කිරීමේ හා වේලාව කළමනාකරණය කිරීමේ නිපුණතාවන්

**වයස** : අවුරුදු 60 ට අඩු විය යුතුය.

**වැටුප** : මාසිකව රු. 150,000.00

**කාලසීමාව** : මාස 06 ක් (මහා භාණ්ඩාගාරයේ අනුමැතිය මත සේවාව දීර්ඝ කිරීමේ පදනමට යටත්ව)

**ප්‍රවාහනය** : රාජකාරි කටයුතු සඳහා සපයනු ලැබේ.

**සේවා ස්ථානය** : සතියකට අවම වශයෙන් දින තුනක් අලිමංකඩ ලුණු ලේවායට පුද්ගලිකව වාර්තා කළ යුතුය.

තමා විසින් පිළියෙල කරන ලද ජීව දත්ත / අයදුම්පත සහතිකවල පිටපත් සමග 2022.07.07 වෙනි දිනට පෙර හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනයට යොමු කළ යුතුය. අයදුම්පත බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ තනතුරේ නම සඳහන් කළ යුතුය.

**සභාපති,**
**ජාතික ලුණු සමාගම,**
**කර්මාන්ත අමාත්‍යාංශය,**
**අංක 561/3, ඇල්විටිගල මාවත, කොළඹ - 05.**